සැ. යු. : (i) 2025.09.12 දින පළ කරන ලද අංක 2454 ගැසට් පත්‍රයේ IV අ කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,455 - 2025 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාදා - 2025.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1948 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1970 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1945 - B 82720 — (2025/09)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීමෙ හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් ජේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

## මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ කාර්මික ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීම 2025
## The Recruitment to the Post of Technician of the Department of Measurement Units, Standards and Services - 2025

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ (PL 3 – 2025) කාර්මික ශිල්පී තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර " අධ්‍යක්ෂ, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව, මාහේනවත්ත, පිටිපන, හෝමාගම" යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ කාර්මික ශිල්පී තනතුරු සඳහා බඳවා ගැනීම 2025 " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2025.10.21 දින වේ.**

**සටහන :** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධ ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර එවීම ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :
වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් හෝ පරීක්ෂක මණ්ඩලයක් මගින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයට ලකුණු 40% ක් හෝ ඊට වඩා ලබා ඇති අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙලට බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් හෝ පරීක්ෂණ මණ්ඩලයක් මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමතකර ඇති ලකුණු දීමේ පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේ ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට සුදුසුකම්ලත් අයදුම්කරුවන් පමණක් අදාළ තනතුරුවලට මිනුම් ඒකක, ප්‍රමිති සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලැබේ.

02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

III. III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු ය.

IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාල අනුව සපුරා ගත යුතුය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. වැටුප් පරිමාණය :
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 යටතේ PL3-2025

රු. 42,780-10 x490-10 x 540-10 x 590 -12 x 630-රු. 66,540 ක

(මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. (එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප් ගෙවනු ලැබේ). මෙයට අමතරව රජයේ නිලධාරීන් වෙත රජය විසින් කලින් කළට ගෙවනු ලබන දීමනා ද හිමි වේ.

04. තනතුරේ කාර්ය භාරය :
ප්‍රධාන විදුලි පද්ධතියේ නඩත්තු කටයුතු, අලුත්වැඩියා කටයුතු සඳහා සහාය වීම, විදුලි පරිපථවල දෝෂ හඳුනා ගැනීමට සහායවීම, ඉලෙක්ට්‍රෝනික උපකරණවල සුළු අලුත්වැඩියා කටයුතු, පරීක්ෂණාගාරයේ කටයුතුවලට අවශ්‍ය අවස්ථාවල දී සහායවීම හා තනතුරට අදාළව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි.

05. සුදුසුකම් :

5.1 අධ්‍යාපනික සුදුසුකම් :
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම් :
ඉහත 04 හි සඳහන් පරිදි තනතුරේ කාර්යභාරයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය

කුසලතාවන්හි NVQ සිව්වැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

5.3 පළපුරුද්ද :

අදාළ ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු සක්‍රීය පළපුරුද්දක් තිබිය යුතුය.

5.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.5 වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වයස් සීමාව අවුරුදු 18 ක්වන අතර, උපරිම වයස් සීමාව අවුරුදු 45 ක් වේ. රජයේ සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

5.6 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි අයකු විය යුතුය.
III. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

06. විෂය නිර්දේශය :

6.1 වෘත්තීය පරීක්ෂණය :

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL-03-2025) කාර්මික ශිල්පී තනතුර සඳහාවන වෘත්තීය පරීක්ෂණය පහත සඳහන් විෂය නිර්දේශයෙන් සමන්විත වේ. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් හෝ පරීක්ෂණ මණ්ඩලයක් මගින් වෘත්තීය පරීක්ෂණය සිදු කරනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණය | ජාතික වෘත්තීය කුසලතාවන්හි NVQ සිව්වැනි (04) මට්ටමට අදාළව පරීක්ෂණය පවත්වනු ලැබේ. | පැය 1 | 100 | 40% |

6.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - ලකුණු 100 යි.

ප්‍රායෝගික පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වඩා ලබා ඇති අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙලට බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබේ. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත දැක්වෙන පරිදි ලකුණු ලබාදීම සිදුකරනු ලැබේ.

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | 40% |
| අතිරේක පළපුරුද්ද | 40 | |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| භාෂා ප්‍රවීණතාවය | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | 100 | |

*සටහන* : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම, පත්වීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

07. විභාග කොන්දේසි :

I. වෘත්තීය පරීක්ෂණය සඳහා සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවලින් අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයකුට ස්වකීය අයදුම් පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

II. ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් සකස් කළ යුතු අතර, අංක 01 සිට 10 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, අංක 11 සිට 13 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය තෙවන පිටුවට ද ඇතුළත්වන පරිදි තම අත් අකුරින්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේපවන බව ද වැඩිදුරටත් දන්වමි.

III. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ට පමණක් කැඳවීම් ලිපි නිකුත් කරනු ලැබේ. වෘත්තීය පරීක්ෂණය ආරම්භවන දිනයේ කැඳවීම් ලිපිය සහ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. අපේක්ෂකයකුට කැඳවීම් ලිපියක් නිකුත් කිරීම ඔහු හෝ ඇය තෝරාපත්කර ගැනීමට සුදුසුකම් සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

IV. වෘත්තීය පරීක්ෂණය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂවරයා සතු වේ.

V. වෘත්තීය පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පත්වීම් බලධාරියා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

VI. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* : ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම වෘත්තීය පරීක්ෂණ ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතුය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(I). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්ත -මේන්තුව මගින් නිකුත්කළ ජාතික හැඳුනුම්පත,
(II). වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(III). වලංගු රියදුරු බලපත්‍රය.

(VII). **සැළකිය යුතුය :**

(*අ*) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(*ආ*) සෑම අයදුම්කරුවෙක්ම අයදුම්පත්‍රයේ තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්, දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් තම අයදුම්පත් එවිය යුතුය. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන රජයේ විදුහලක විදුහල්පති/ සාමදාන විනිශ්චයකාරවරයකු/ නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු: 82,150.00 හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(VIII). සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් වෘත්තීය පරීක්ෂණයට කලින් හෝ වෘත්තීය පරීක්ෂණය පවත්වන කාලයේ දී හෝ වෘත්තීය පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑ කමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

08. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අදාළ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

09. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

10. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂවරයා සතුවන අතර, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් වේ නම් එවැනි විටෙක සිංහල නිවේදනය බලාත්මක වේ.

එස්. එන්. අකුරන්තිලක,
මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ.

2025 සැප්තැම්බර් මස 04 වැනි දින,
මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
මාහේනවත්ත,
පිටිපන,
හෝමාගම.

ආදර්ශ ඉල්ලුම්පත්‍ර ආකෘතිය

***මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්මික ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය - 2025***

***The Recruitment to the Posts of the Technician of the Department of Measurement Units, Standards and Services- 2025***

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා [ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය සිංහල-02 දෙමළ-03 ඉංග්‍රීසි-04 [ ]

---

1. මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් :
උදාහරණ - BANDARA. A. B. ......................................................................................................
.........................................................................................................................................

.

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසි කැපිටල් අකුරින් :
.........................................................................................................................................
. ......................................................................................................................................

3. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :
.........................................................................................................................................
.........................................................................................................................................

4. ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)
.........................................................................................................................................
.........................................................................................................................................

5. ස්ත්‍රී /පුරුෂ භාවය : (පුරුෂ - 1, ස්ත්‍රී - 2) [ ]
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

6. විවාහක/අවිවාහක බව : (විවාහක -1,අවිවාහක -2, වෙනත් - 3) [ ]
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

7. ජන වර්ගය : (සිංහල-1, දෙමළ -2, ඉන්දියානු දෙමළ-3, මුස්ලිම් -4, වෙනත් -5) [ ]
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

8. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

09. දුරකථන අංකය :

ජංගම :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ස්ථාවර :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

10. (අ) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ආ) ඉල්ලුම් පත් කැඳවීමේ අවසාන දිනට වයස - (2025.10.21 )

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

11. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් :

11.1 අ.පො.ස (සා.පෙළ) විභාගය :

විභාගය සමත් වූ වර්ෂය : ...................... විභාග අංකය :............................

| | *විෂයය* | *ලැබූ සාමාර්ථය* | | *විෂයය* | *ලැබූ සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

11.2 වෙනත් අධ්‍යාපනික /වෘත්තීය සුදුසුකම් **:**

| *විභාගය* | *දිනය* | *ආයතනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

11.3 **ලබා ඇති** ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ මට්ටම) :

| *හදාරා ඇති පාඨමාලාව* | *ආයතනය* | *ලබා ඇති NVQ මට්ටම* | *NVQ පාඨමාලාව සම්පූර්ණ කළ දිනය (සහතිකය වලංගුවන දිනය)* |
|---|---|---|---|
| | | | |
| | | | |

(අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතික පත්වල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. )

12. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේ ද? (එසේනම් විස්තර සපයන්න.) හෝ ඔබට විරුද්ධව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම්) දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කර තිබේ ද?
..............................................................................................................................................................

13. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියකින් වරදකරු වී තිබේ ද?

.................................................................................................................................................................................

14. **අයදුම්කරුගේ සහතිකය :**

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, බඳවා ගැනීමේ නීතිරීතිවලට අනුව ක්‍රියා කරවීමටත් මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, වෘත්තීය පරීක්ෂණයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුව ද මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත්වන බවත් බඳවා ගැනීමට අදාළව ගනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

……………….. ……………………..
දිනය අයදුම්කරුගේ අත්සන

15. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙහි අත්සන් කරන ලද ............................................................හි පදිංචි .............................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහුගේ/ඇයගේ අත්සන ...............................දින මා ඉදිරිපිට දී තැබූ බවත් සහතික කරමි.

..................................
සහතික කරන්නාගේ අත්සන
හා නිලමුද්‍රාව

සහතික කරන්නාගේ නම :...............................................
තනතුර: ..............................................
ලිපිනය :..............................................
දිනය : ................................................

16. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා පමණක් අදාළ වේ)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ /ආයතනයේ සේවය කරන ..............................මයා/ මිය/ මෙනවිය දැනට ............. ............................ තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ /ඇයගේ වැඩ හා සහ හැසිරීම සතුටුදායක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි ය/නොහැකි ය.

..........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව

දිනය : ................................

09-137

**වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය**

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මිනුම් ප්‍රමිති හා සේවා සහායක තනතුරට බඳවා ගැනීම 2025

The Recruitment to the Post of Measurement Standard and Service Attendant of the Department of Measurement Units, Standards and Service 2025

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ (PL 2-2025) මිනුම් ප්‍රමිති හා සේවා සහායක තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **"අධ්‍යක්ෂ, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව, මාහේන වත්ත, පිටිපන, හෝමාගම "** වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහාවන වෘත්තීය පරීක්ෂණය - 2025"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

**(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2025.10.21 දින වේ.**

*සටහන*: ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධ ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතු ය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

(අ). 04 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවීමට කටයුතු කරනු ලැබේ ;

(ආ). මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයට 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙලට බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(I). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය. එතෙකුදු වුවත් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධාරීන් යටත් විය යුතුවේ.

(II). පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

(III). රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාල අනුව සපුරා ගත යුතු ය.

(IV). රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. **වැටුප් පරිමාණය**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව PL 2-2025

රු: 41,800 - 10 x 490-10 x 540-10 x 590 -12 x 630 - රු. 65,560/=

(මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. (එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප් ගෙවනු ලැබේ.)

04. **සුදුසුකම් :**

4.1 අධ්‍යාපනික සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී, ගණිතය හා භාෂාව ඇතුළුව විෂයයන් හයකට සාමාන්‍ය සාමාර්ථ සහිතව සහ අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව සමත් වී තිබිය යුතුය.

4.2 වෘත්තීය සුදුසුකම් :

පහත සඳහන් කර ඇති /විෂය ක්ෂේත්‍රයකට අදාළ වන පාඨමාලාවන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම NVQ 3 මට්ටම ලබා තිබීම:

1. යාන්ත්‍රික තාක්ෂණ ශිල්පය;
2. විද්‍යුත් තාක්ෂණ ශිල්පය;
3. තොරතුරු තාක්ෂණ ශිල්පය;
4. කාර්මික තාක්ෂණ ශිල්පය;
5. පරිගණක තාක්ෂණ ශිල්පය;
6. තොරතුරු දත්ත පද්ධති ශිල්පය;

*සටහන* : 4.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් නොමැති අවස්ථාවක දී රාජ්‍ය පරිපාලන

චක්‍රලේඛ 28/2016 ප්‍රකාරව 4.2 හි වන සුදුසුකම් පමණක් සහිත අයදුම්කරුවන් ද සලකා බැලේ.

4.3 කායික සුදුසුකම් :

1. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්;
11. තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

4.4 වයස :

1. අවම සීමාව - අවුරුදු 18
11. උපරිම සීමාව - අවුරුදු 45

4.5 වෙනත් සුදුසුකම් ;

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය
11. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
111. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

05. විෂය නිර්දේශය :

5.1 වෘත්තීය පරීක්ෂණය

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (PL-02-2025) මිනුම් ප්‍රමිති හා සේවා සහායක තනතුර සඳහා වන වෘත්තීය පරීක්ෂණය පහත සඳහන් විෂය නිර්දේශයෙන් සමන්විත වේ.

විභාගය පහත සඳහන් පරිදි වේ. :-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **ප්‍රායෝගික පරීක්ෂණය** | **පැය 01** | **100** | **40 %** |

විෂය නිර්දේශය පහත පරිදි වේ :-

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණය | වෘත්තියේ දී නිතර භාවිතා වන මිනුම් උපකරණ හා ආයුධවල නම, භාවිතය හා ඒවායේ නඩත්තු කටයුතු පිළිබඳ සාමාන්‍ය දැනීම. |

06. විභාග කොන්දේසි :

I. වෘත්තීය පරීක්ෂණය සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා වලින් අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයකුට ස්වකීය අයදුම් පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

II. ඉල්ලුම් පත්‍රය සෙ.මී.22-29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් සකස් කළ යුතු අතර, අංක 01 සිට 09 තෙක් ශීර්ෂ පළමු වන පිටුවටද, අංක 10 සිට 13 තෙක් ශීර්ෂ දෙවන පිටුවටද, ඉතිරිය තෙවන පිටුවටද ඇතුළත්වන පරිදි තම අත් අකුරින්ම අයදුම්පත පිරවිය යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත. තවද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය.එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේපවන බවත් වැඩිදුරටත් දන්වමි.

III. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ට පමණක් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන අතර, ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුල්වීමට ඉඩ දෙනු නොලැබේ. වෘත්තීය පරීක්ෂණය ආරම්භ වන දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය සහ ජාතික හැඳුනුම්පත පමණි. අපේක්ෂකයකුට ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය තෝරා පත් කර ගැනීමට සුදුසුකම් සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

IV. වෘත්තීය පරීක්ෂණය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය වෘත්තීය පරීක්ෂණය පවත්වන බලධාරියා සතු වේ.

V. වෘත්තීය පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පත්වීම් බලධාරියා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

VI. අපේක්ෂකයාගේ අනන්‍යතාවය : ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම වෘත්තීය පරීක්ෂණ ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(I). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ;

(II). වලංගු විදේශ ගමන් බලපත්‍රය ;

(III). වලංගු රියදුරු බලපත්‍රය ;

(VII). **සැලකිය යුතුය :**

(අ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ ;

(ආ) විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙක්ම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. අයදුම්කරු දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියකු නම් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් තම අයදුම්පත් එවිය යුතු ය. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන රජයේ විදුහලක විදුහල්පති/ සාමදාන විනිශ්චයකාරවරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 82,150.00 හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කල යුතු ය ;

(VIII). සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් වෘත්තීය පරීක්ෂණයට කලින් හෝ වෘත්තීය පරීක්ෂණය පවත්වන කාලයේ දී හෝ වෘත්තීය පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

07. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අදාළ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

09. මෙම රෙගුලාසි වල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

එස්. එන්. අකුරන්තිලක,
මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ,
මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව.

2025 සැප්තැම්බර් මස 04 වැනි දින,

**ආදර්ශ ඉල්ලුම් පත්‍ර ආකෘතිය**

*මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මිනුම් ප්‍රමිති හා සේවා සහායක තනතුරට බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය - 2025*

*The Recruitment to the Posts of Measurement Standard and Services Attendant, Department of Measurement Units, Standards and Services- 2025*

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : සිංහල-02 දෙමල-03 ඉංග්‍රීසි-04

***සටහන*** : අයදුම් කරන මාධ්‍ය වෙනස් කළ නොහැක.

---

1. මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් :
*උදාහරණ* - BANDARA. A. B. ..........................................................................................
....................................................................................................

.

2. මුලකුරු වලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසි කැපිටල් අකුරින්:
....................................................................................................
. ..................................................................................................

3. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්):
....................................................................................................
....................................................................................................

4. ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :
....................................................................................................
....................................................................................................

5. ස්ත්‍රී /පුරුෂ භාවය : (පුරුෂ - 1, ස්ත්‍රී - 2)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

6. විවාහක/අවිවාහක බව : (විවාහක -1,අවිවාහක -2, වෙනත් - 3)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

7. ජන වර්ගය : (සිංහල-1, දෙමළ -2, ඉන්දියානු දෙමළ-3, මුස්ලිම් -4, වෙනත් -5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

8. ජාතික හැඳුනුම්පත් අංකය :

9. (අ) උපන් දිනය :

වර්ෂය මාසය දිනය

(ආ) ඉල්ලුම් පත් කැඳවීමේ අවසාන දිනට වයස - (2025.10.21 )

අවුරුදු මාස දින

10. දුරකථන අංකය :

ස්ථාවර :

ජංගම :

11. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් :

11.1 අ.පො.ස (සා.පෙළ) විභාගය :

විභාගය සමත් වූ වර්ෂය...................... විභාග අංකය............................

| | *විෂයය* | *ලැබූ සාමාර්ථය* | | *විෂයය* | *ලැබූ සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

11.2 වෙනත් අධ්‍යාපනික /වෘත්තීය සුදුසුකම් :

| *විභාගය* | *දිනය* | *ආයතනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

11.3 ලබා ඇති ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ මට්ටම)

| *හදාරා ඇති පාඨමාලාව* | *ආයතනය* | *ලබා ඇති NVQ මට්ටම* | *NVQ පාඨමාලාව සම්පූර්ණ කළ දිනය (සහතිකය වලංගු වන දිනය)* |
|---|---|---|---|
| | | | |
| | | | |

(අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික පත්වල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. )

12. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේද? (එසේනම් විස්තර සපයන්න.) හෝ ඔබට විරුද්ධව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම්) දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කර තිබේද?
.............................................................................................................................................................

13. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියකින් වරදකරු වී තිබේද?

.........................................................................................................................................................................

14. **අයදුම්කරුගේ සහතිකය :**

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, බඳවා ගැනීමේ නීතිරීතිවලට අනුව ක්‍රියා කරවීමටත් මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, වෘත්තීය පරීක්ෂණයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුවද මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වන බවත් බඳවා ගැනීමට අදාළව ගනු

ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

……………….. ……………………..
දිනය අයදුම්කරුගේ අත්සන

15. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙහි අත්සන් කරන ලද ..........................................................හි පදිංචි ............................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහුගේ/ඇයගේ අත්සන ..............................දින මා ඉදිරිපිට දී තැබූ බවත් සහතික කරමි.

.................................
සහතික කරන්නාගේ අත්සන
හා නිලමුද්‍රාව

සහතික කරන්නාගේ නම :...............................................
තනතුර: ..............................................
ලිපිනය :..............................................
දිනය : ...............................................

16. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : -**

(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා පමණක් අදාළ වේ)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ /ආයතනයේ සේවය කරන ..............................මයා/ මිය/ මෙනවිය දැනට ........... .............................. තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ /ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

..........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව.

දිනය : ................................

09-138

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීම - 2025**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි තනතුරෙහි පවත්නා පුරප්පාඩු එකසිය හතක් (107) සඳහා පත්කිරීමට සුදුස්සන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලත් පශු වෛද්‍ය විද්‍යා උපාධිධාරීන්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ “ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි තනතුරු”යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2025.10.18** දින වේ.

**සටහන :** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. **සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

i. පශු වෛද්‍ය නිලධාරි තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කුසලතා ලේඛනය මත බඳවා ගනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් විශ්වවිද්‍යාලයකින් පශු වෛද්‍ය උපාධි සුදුසුකම් ලබාගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන වසරට අදාළව ලියාපදිංචි දිනය අනුව අනුපිළිවෙලින්, කුසලතා ලේඛනයේ අවසානයට ඇතුළත් කරනු ඇත.

ii. පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට එකසිය දහයකට (110%) සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, කුසලතා ලේඛණයේ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමක් සිදු නොකෙරේ.

iii. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ පශු වෛද්‍ය නිලධාරි තනතුරක පුරප්පාඩු පිරවීම සඳහා පත් කරනු ලැබේ.

iii. තනතුරට පත් කරනු ලබන අයදුම්කරුවන්, 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවයක් ලබාගත යුතු වේ. ඔබගේ බඳවා ගැනීමේ මාධ්‍යය වනුයේ ඔබ විසින් උපාධිය සම්පූර්ණ කරන ලද මාධ්‍යය වේ. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර රාජ්‍ය භාෂාවක III මට්ටමේ ප්‍රවීණතාවයක් ලබාගත යුතු වේ.

iv. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටින්නේය.

v. සෙසු සේවා නියමයන් සහ සේවා කොන්දේසි 2013.12.13 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින්වර නිකුත් කරන ලද සංශෝධන නියමයන්වලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. **වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 82,150 – 10 x 2,400 – 8 x 2,940 – 17 x 3,900 - රු. 195,970(SL1-2025) වේ.

ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

4. **අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක්.

5. **වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

6. **කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

7. **වෙනත් සුදුසුකම් :**

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබීම ඇතුළුව මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. **සම්මුඛ පරීක්ෂණය :**

8.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය** (ලකුණු ලබාදෙනු නොලැබේ.)

*ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු* - සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම

9. **ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

i. ඉල්ලුම්පත්‍රය සෙ.මී. 22 – 29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ආදර්ශ අයදුම්පත අනුව සකස් කළ යුතුය.

ii. සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම් දුන් විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

a. ජාතික හැඳුනුම්පත / වලංගු ගුවන් ගමන් බලපත්‍රය ;
b. උප්පැන්න සහතිකය ;
c. උපාධිය හා අදාළ වෙනත් සහතික ;
d. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එකක් ස්වදේශ කටයුතු චක්‍රලේඛ 03/2020 පරිදි පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් DS4 සහතිකයක් විය යුතුය.) ;
e. සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සමත් වූ උසස්ම විභාගවල සහතික ;
f. පශු වෛද්‍යවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමේ සහතිකය.

10. **වෙනත් විධිවිධාන :**

i. මෙම *ගැසට්* නිවේදනයේ විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වනු ඇත.

ii. පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

iii. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.

iv. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.

v. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති යම්කිසි කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇතිනම් බව හෙළිවුවහොත් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.

2025 සැප්තැම්බර් මස 19 වැනි දින.

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි පුරප්පාඩුවලට බඳවා ගැනීමේ අයදුම්පත - 2025**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. (i) මුලකුරු සමඟ නම :

සිංහලෙන් : ……………………
ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. තැපැල් ලිපිනය : ……………………
(ලිපිනයෙහි යම් වෙනසක් සිදු වුවහොත්, වහාම ඒ බව දැනුම් දිය යුතුය.)

04. ස්ථිර පදිංචි ස්ථානය අයත් :

(i) පළාත් සභාව : ……………………

(ii) දිස්ත්‍රික්කය : ……………………

05. දුරකතන අංකය : ස්ථාවර දුරකථන අංකය

ජංගම දුරකථන අංකය

06. උපන් දිනය : වර්ෂය : ..................... මාසය : ....................... දිනය : .......................

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු : ..............මාස : ...............දින : ...............

07. (අ) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන බව : ........................

(ආ) ජාතිය (සිංහල/ ශ්‍රී ලංකා ද්‍රවිඩ/ ඉන්දියානු ද්‍රවිඩ/මුස්ලිම්/ වෙනත්) : ............................

08. (අ) ස්ත්‍රී/ පුරුෂ භාවය : .................

(ආ) විවාහක/ අවිවාහක/ වැන්දඹු ද යන වග : ................

09. අධ්‍යාපන සුදුසුකම් :

| සමත් වූ උපාධිය/ පශ්චාත් උපාධි සුදුසුකම් | පන්තිය | විශ්වවිද්‍යාලය | උපාධිය සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|
| 1.<br>2.<br>3. | | | |

10. ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය හා දිනය : ..................

11. සේවා විස්තර : (දැනට ස්ථිර තනතුරක් දරන්නේ නම්)

| දැනට දරන තනතුර | සේවා කාලය | | සේවා ස්ථානය | දෙපාර්තමේන්තුව/ පළාත් සභාව |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| 1.<br>2.<br>3. | | | | |

12. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධි වරදකට වැරදිකරුවෙකු වී නොමැති බවද මගේ සුපුරුදු අත්සන තබා මින් සහතික කරමි.

.................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..................
(දැනට රජයේ ස්ථිර තනතුරක් දරන අපේක්ෂකයන්ට පමණක් අදාළ වේ)

1. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :

ඉහත අයදුම්කරු වූ .............................. මහතා/ මිය/ මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ................. පළාත් සභාවේ .............................. තනතුරක් දරන නිලධාරිවරයෙකු බවත් ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ/ ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු/ ඇය මෙම දෙපාර්තමේන්තුවෙන්/ පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හැකි/ නොහැකි බවත් දන්වමි.

(අදාළ නොවන වචන කපා හරින්න)

................................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා
(නිල මුද්‍රාව)

දිනය : ..........................

ලිපිනය : .......................

09-199

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවික ශිල්පීන් හා ශිල්පිනියන් සඳහා පුරප්පාඩු පවතින අතර, පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි හා කාන්තා අයදුම්කරුවන්ගෙන්/ අයදුම්කාරිනියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන් ම සපුරාලිය යුතුය.

| | | |
|---|---|---|
| අ. | පුරවැසිභාවය යුතුයි. | - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය |
| ආ. | වයස | - 2025 ඔක්තෝබර් මස 10 වන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 24 ට නොවැඩි විය යුතුය. |
| ඇ. | උස | - පිරිමි 5' 5"(සෙ.මී 165.10) කාන්තා 5' 2" (සෙ.මී 157.48). |
| ඈ. | ශරීර ස්කන්ධ දර්ශකය | - 17-27. |
| ඉ. | පපුව | - (පිරිමි) 32"(සෙ.මී 81.28). |
| ඊ. | වර්ණ දර්ශනය | - එස්ටීඩී II |
| උ. | දුර දර්ශනය | - 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) (6/12 දෘෂ්ටි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සලකා බැලිය හැක). |
| ඌ. | සිවිල් තත්ත්වය | - අයදුම්කරුවන් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී විවාහ ගිවිස ගැනීමට අවසර දෙනු නොලැබේ. |

2. **බඳවා ගනු ලබන අංශයන් :**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් හෝ ශ්‍රී ලංකා නාවික තාක්ෂණ ආයතනය මගින් පිරිනමනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව සඳහා පහත සඳහන් අංශයන් වෙත බඳවා ගනු ලැබේ.

(1) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (නාවික ඉංජිනේරු)
(2) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (මෝටර් රථ ඉංජිනේරු)
(3) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු)
(4) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු)
(5) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (නැව්බඳ අලුත්වැඩියාවන් සහ නැව් තැනීම සම්බන්ධ ඉංජිනේරු)

3. **අධ්‍යාපන සුදුසුකම් :**

අ. අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව මව්බස, ඉංග්‍රීසි භාෂාව සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය.

ආ. අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා,

(1) භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ පෙනී සිටීම
හෝ
(2) ජීව විද්‍යා විෂය ධාරාව යටතේ පෙනී සිටීම
හෝ
(3) තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ,තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්‍ෂණවේදය යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම

4. ඉහත 1 සහ 3 ඡේදයන් හි දක්වා ඇති අවශ්‍යතා සපුරාලනු නොලබන අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්‍ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්‍ෂාව කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ/අයදුම්කාරිනියකගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි එකී අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පිළිබඳ සලකා බලනු ලැබේ.

5. **සේවා කොන්දේසි :**

අ. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර,ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

ආ. පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව, ආධුනිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

ඇ. සෑම ආධුනිකයෙකුට සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම් සපයනු ලැබේ.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළ, ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ආහාර නාවික හමුදාව මගින් සපයනු ලැබේ.

ඉ. පුහුණුවන කාලසීමාව තුළ දී, යම් ආධුනිකයෙකු හට සිය කැමැත්තෙන් නාවික හමුදාවෙන් ඉවත් වීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

ඊ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී, යම්කිසි ආධුනිකයකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ ඇය නාවික හමුදාවේ සේවය සඳහා යෝග්‍ය නොවේ යැයි වගකිවයුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේ දී ම අදාළ ආධුනිකයා විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුයි.

උ. සියලුම නාවිකයෝ රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට හෝ විදේශ රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වෙති.

6. **රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා :**

තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

7. **වැටුප් හා දීමනා :**

2025.04.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2025 අනුව වේ.

ඒ අනුව,

| | | |
|---|---|---|
| අ. | මූලික වැටුප | - රු. 45,037.00 |
| ආ. | ජීවන වියදම් දීමනාව | - රු. 17,800.00 |
| ඇ. | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - රු. 350.00 |
| ඈ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඉ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඊ. | අනෙකුත් දීමනා | - විශේෂ දීමනාව රු. 1,000.00<br>- විශේෂ අමතර දීමනාව රු. 2,400.00 |
| උ. | දළ වැටුප | **- රු 66,587.00** |
| ඌ. | සලාක දීමනාව (අවස්ථානුකූලව) | - රු. 29,025.00 |
| එ. | දළ වැටුප ආසන්න වශයෙන් (සලාක දීමනාව ඇතුළත්ව) | **- රු. 95,612.00** |

ඒ. නොමිලයේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට,ළමයින්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

ඔ. කඳවුර තුළ වාසය කරන නාවිකයින්ට මසකට වරක් නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඕ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට, ළමයින්ට සහ යැපෙන්නන්ට).

ක. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නාවිකයින්ට රු.2,400.00 සිට රු.6,600.00 දක්වා ගෙවල් කුළී දීමනාවක් හිමි වේ.

ග. විවාහක නාවිකයින් සඳහා විවාහක නිවස්නයන්හි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

ච. මූලික පුහුණුවෙන් පසු පිටත වාසය කරන විවාහක නාවික පුද්ගලයින් සඳහා මසකට ආසන්න වශයෙන් රු. 29,025.00 ක මුදලක් සලාක දීමනාව වශයෙන් ගෙවනු ලබයි.

8. **වරප්‍රසාද :**

නාවික හමුදාවේ ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා විශේෂිත වූ උසස්වීම් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරන අතර, ඒ අනුව ශිල්පීය නාවිකයින්ට පුරප්පාඩු මත පදනම් නොවූ උසස්වීම් ලබා ගැනීමේ හැකියාව ඇත.

9. **අයදුම්කරුවන්ට උපදෙස් :**

අ. අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. අයදුම්පත් **2025 ඔක්තෝබර් මස 10 වැනි දින 1200** පැයට ප්‍රථම ලැබෙන සේ **"ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්), නාවික හමුදා මූලස්ථානය, තැපෙ 593, කොළඹ 01"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ **"ආධුනික නාවික ශිල්පීන් බඳවා ගැනීම"**යනුවෙන් සටහන් කළ යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක : 011-7195162, 011-7195155, 076-0275685 මගින් ලබා ගත හැක.

ආ. රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු පුද්ගලයින්ගේ

අයදුම්පත්,අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් ලෙස තෝරා ගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

ඈ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙන යම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතු ය :-

(1) උප්පැන්න සහතිකය;
(2) අයදුම් කර ඇති අංශයන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික;
(3) පාසල් හැරයාමේ සහතිකය;
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය;
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පුහුණුවක් සහ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;
(6) මෑතක දී ලබා ගත් චරිත සහතික තුනක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන්/ විදුහල්පතිතුමියගෙන් විය යුතු අතර, අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයකුගෙන් හෝ වත්මන් සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී සිටී නම්) විය යුතු ය;
(7) ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

ඇ. නියම කරන ලද අවස්ථාවන් හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත සමග නොඑවිය යුතු ය.

ඊ. අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව විසින් ඊට වගකියනු නොලැබේ.

10. අයදුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබීම, එම අසත්‍යතාවය අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

11. **තෝරා ගැනීමේ/ සම්මුඛ පරීක්ෂණ ආදිය :**

අ. ඉහත අවශ්‍යතා සපුරාලන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයකින් අනතුරුව තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවේ. එම සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතු ය.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා

| **ඉසව්ව** | **කාලය (මිනිත්තු/ තත්පර)** | **පිරිමි** | **කාන්තා** |
|---|---|---|---|
| මීටර් 1600 දිවීම | — | මිනිත්තු 09 | මිනිත්තු 11 |
| Push Up | මිනිත්තු 01 | 12 ක් හෝ ඊට වැඩි | 08 ක් හෝ ඊට වැඩි |
| Sit Up | මිනිත්තු 01 | 10 ක් හෝ ඊට වැඩි | 07 ක් හෝ ඊට වැඩි |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පමණක් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, ඉන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවිකයන් ලෙස බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

ඇ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ජංගම දුරකථන අංකයට අදාළව වට්ස්ඇප් (WhatsApp) පණිවුඩ මගින් පමණක් දැනුම් දෙනු ලබන අතර තැපැල් මගින් හෝ වෙනත් කිසිදු ආකාරයකින් සිදු නොකෙරේ. තවද සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඉ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

ඊ. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරකු විසින් වුව ද එසේ කල යුත්තේ අයදුම්කරුට/ අයදුම්කාරිනියට ලිඛිත චරිත සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සහ කිරීම, අයදුම්කරු/අයදුම්කාරිනිය නුසුදුසු අයකු වීමට හේතු වන්නේ ය.

උ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරිනියන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

ඌ. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

එ. සියළුම අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන්ගේ ආරක්ෂක නිශ්කාශණ වාර්ථා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

ඒ. ශ්‍රී ලංකා නාවික හමුදාවට අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතුවන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවයන් සහ කොන්දේසි වල වෙනස් කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතු වේ.

*සටහන* - මෙම ගැසට් නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම පළවන අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

බීජ්කේඑස්පී බානගොඩ,
ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී
වයිස් අද්මිරාල්
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැපෙ 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයට ආධුනික නාවිකයින් බඳවා ගැනීම සඳහා වූ ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය ..........................................................................................

(ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පෙළපතින්ද , ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. අයදුම් කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) ..........................................................................................

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) ..........................................................................................

4. ජාතික හැඳුනුම්පත් අංකය ..........................................................................................

5. ස්ථිර ලිපිනය ..........................................................................................

6. තැපැල් ලිපිනය ..........................................................................................

7. උපන් දිනය ..........................................................................................

8. වයස අවුරුදු ....... මාස ....... දින ....... (2025 ඔක්තෝබර් මස 10 දිනට)

9. උස ...........(අඟල්) පපුව ........(අඟල් - පිරිමි) බර ........(කි.ග්‍රෑ)

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය..........................................................................................

11. දිස්ත්‍රික්කය ..........................................................................................

12. ඡන්ද කොට්ඨාසය ...................................................................................

13. ග්‍රාම නිලධාරි කොට්ඨාසය ...................................................................................

14. දුරකථන අංකය ...................................................................................

15. වට්ස්ඇප් (WhatsApp) අංකය ...................................................................................

16. විවාහක හෝ අවිවාහක බව ...................................................................................

17. ස්ත්‍රී /පුරුෂ භාවය ...................................................................................

18. අධ්‍යාපනය ලැබූ පාසල් (අනුපිළිවෙලින් සඳහන් කරන්න)...................................................................................

19. පාසල/ පාසල් හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර ...................................................................................

| *පාසලේ / විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස . (සා.පෙළ)<br>අ.පො.ස . (උ.පෙළ)<br>වෙනත් | | |

| *පාසලේ නම* | *අ.පො.ස උ/පෙළ පෙනී සිටි විෂය ධාරාව* | *විභාගයට පෙනී සිටි වර්ෂය* |
|---|---|---|
| | භෞතික විද්‍යා විෂය ධාරාව<br>ජීව විද්‍යා විෂය ධාරාව<br>තාක්ෂණවේදය විෂය ධාරාව | |

20. පාසලෙන් / විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර -

| *සේවා යොජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර -

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා<br>මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම්

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්යතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම් , දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න)

24. පාසලේ දී , විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න)

25. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේ ද? එසේ නම් , ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදු වූයේ කුමක්දැයි සඳහන් කරන්න.

27. මීට ප්‍රථම යුධ, නාවික සහ ගුවන් හමුදාවල නිත්‍ය හෝ ස්වේච්ඡා බලකායන් හි සේවය කර ඇත්නම් එසේ සේවය කරනු ලැබූ කාල පරිච්ඡේදය හා දැරූ තනතුරු පිළිබඳ සඳහන් කරන්න.

28. ඔබ කිසියම් හේතුවක් මත සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ අත්හිටවූ සිර දඬුවම් ලබා තිබේ ද? එසේ නම් අදාළ විස්තර සඳහන් කරන්න.

29. රජයේ දෙපාර්තමේන්තුවක දී හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකුව , ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන බද්ධ ව්‍යාපාර , සමාගම් ආදිය ඇතුලුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු සඳහන් කරන්න.

30. චරිත සහතික පිළිබඳ විස්තර

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

31. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය -

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඊට අදාළවන කරුණු ද මම කියවා අවබෝධ කර ගතිමි.

දිනය......................................   ..............................................

අයදුම්කරුගේ අත්සන

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් (සුදුසුකම්වලට අදාළ ලිපි ලේඛනවල පිටපත් ද සමග) පහත ලිපිනයට යොමු කරන්න.

**ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්),**
**නාවික හමුදා මූලස්ථානය,**
**තැ.පෙ. 593,**
**කොළඹ 01**

සම්බන්ධතා විස්තර -
දුරකථන : **011-7195155,011-7195162**   ජංගම දුරකථන : **076-0275685**

09-241

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2025

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ (PL - 02) මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුර සඳහා **2025 ඔක්තෝබර් මස කොළඹ දී** පැවැත්වීමට නියමිත බඳවා ගැනීමේ විවෘත තරග විභාගයට සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගන්නා තනතුර — ශ්‍රේණිය
මැනුම් ක්ෂේත්‍ර සහායක — III ශ්‍රේණිය

1.2 තනතුරෙහි රාජකාරි ස්වභාවය :

| *තනතුර* | *ප්‍රධාන කාර්යයන්* |
|---|---|
| මැනුම් ක්ෂේත්‍ර සහායක | • මැනුමට අදාළ දළ සැලැස්ම ඇඳීමට සහාය වීම.<br>• මැනුම් ක්ෂේත්‍ර පොත් සහ පිඹුරු උපයෝගී කරගෙන පැරණි මායිම් නිරීක්ෂණය කිරීමට හැකි වන සේ මැනුම් රේඛා සකස් කිරීම.<br>• මැනුමට අදාළවන ක්ෂේත්‍රයේ පැරණි මායිම්වල අදාළ කුඤ්ඤ මායිම් ගල් පිහිටුවීම සහ විවෘත කිරීම.<br>• මැනුමට අදාළ පිල් ලකුණු සොයා ගැනීම හා පිහිටුවීමට අදාළ මැනුම් රාජකාරිවලට සහාය වීම.<br>• ක්ෂේත්‍රයේ දී භාවිත කරන උපකරණ ආරක්ෂා කිරීම සහ ගබඩාකර ගැනීමට අදාළ නඩත්තු කටයුතුවලට සහාය වීම.<br>*ත්‍රිකෝණමාන ලෙවල් උපකරණ සහ නව ඉලෙක්ට්‍රොනික් පූර්ණමාන ඇතුළු චන්ද්‍රිකා තාක්ෂණය ඇසුරෙන් කරනු ලබන මැනුම් සඳහා වූ G.P.S. උපකරණ ක්ෂේත්‍රයේ මැනුම් ලක්ෂවල ස්ථාන ගත කිරීම.*<br>• ගුවන් ඡායාරූපකරණයට අවශ්‍ය භූමි පාලන ලක්ෂයන් ස්ථානගත කිරීමේ සියලුම කටයුතු සඳහා සහාය වීම.<br>• මැනුම් කටයුතුවල දී ගනු ලබන සියලුම ස්ථානවල පිහිටීම හා මට්ටම නිර්ණය කිරීම සඳහා අවශ්‍ය ඉලක්කයන් දර්ශක විධිමත් අයුරින් තබා ගැනීම, මැනුම් දත්ත එක්රැස් කිරීමට සහාය දැක්වීම.<br>• මැනුම් කටයුතුවල දී නිවැරදි දත්ත භාවිත කර මායිම් ගල්, පිල් ලකුණු භූමියේ පිහිටුවීම.<br>• මැනුම් ක්ෂේත්‍ර පොත් හා අනු රේඛන සටහන්වල දත්ත උපයෝගී කර ගෙන මූලිකව ම කරනු ලබන ඉඩම් කට්ටි කිරීමට අදාළ මායිම් ගල් පිහිටුවීම.<br>• මැනුම්පති විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පවරනු ලබන ඉඩම් මැනුම් සම්බන්ධ ඕනෑම රාජකාරියක නිරත වීම.<br>• මැනුම් ක්ෂේත්‍ර සහායක ශ්‍රේණියේ ඕවර්සියර් තනතුර දරන තැනැත්තන් හට ඉහත රාජකාරිවලට අමතරව, අනෙකුත් මැනුම් ක්ෂේත්‍ර සහායකයන්ගේ කාර්යයන් අධීක්ෂණය ද පැවරේ. |

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 වැටුප :-

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III , II, I හා විශේෂ ශ්‍රේණිය සඳහා අදාළ මාසික වැටුප් පරිමාණය :
**රු.41,800 -10 x 490 -10 x 540 - 10 x 590 - 12 x 630 – 65,560 =/** ක් වේ.

4.0 මෙම තනතුර ස්ථිරය. මෙම විභාගයෙන් මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III ශ්‍රේණියට පත්වන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය අනුව නිර්ණය කරනු ලැබේ. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. මෙම *ගැසට්* නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම්වලට අදාළවන පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.

**5.0 සුදුසුකම් :-**

5.1. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් (06) සමත්වී තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම් :

මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම.

5.3. අවම නිපුණතා :

(*අ*) මැනුම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහාය වීම
(*ආ*) මැනුම් උපකරණ හා ආම්පන්න ආරක්ෂා කිරීම හා නඩත්තුව

5.4. කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.5 වෙනත් :

ii. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
iii. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

5.6 වයස :
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 45 වේ. (රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

6.0 සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම පුරප්පාඩු පිරවීමේ දී කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගිය හොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකරනු ලැබේ.

7.0 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

*විභාග පරිපාටිය* :

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය වලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු *නොලැබේ.*

| | | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත් වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|---|
| I. | සාමාන්‍ය දැනීම | 100 | 40% | පැය 02 |
| II. | බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 විනාඩි 15 |

7.1 විෂය නිර්දේශය :

I. *සාමාන්‍ය දැනීම* : මෙම ප්‍රශ්න පත්‍රය මගින් අපේක්ෂකයා වාසය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික, ආගමික හා ආර්ථික පරිසරය

ද විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද අන්තර්ජාතිකව වැදගත්වන සාමාන්‍ය කරුණු පිළිබඳ දැනුම ද අපේක්ෂා කෙරේ.

II. *බුද්ධි පරීක්ෂණය* : අපේක්ෂකයාගේ සිතීමේ ශක්තිය, තර්කානුකූලභාවය, අවස්ථානෝචිත තීරණ ගැනීමේ හැකියාව ද මැනීම සඳහා වූ බහුවරණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

7.2 *විභාග ප්‍රතිඵල* : අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම සර්වේයර් ජනරාල්වරයා විසින් තැපෑලෙන් හෝ www.survey.gov.lk වෙබ් අඩවිය මගින් සිදුකරනු ලැබේ.

8.0 සම්මුඛ පරීක්ෂණය:

8.1. සර්වේයර් ජනරාල් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සහතික පරීක්ෂා කිරීම පමණක් සිදුකරන සම්මුඛ පරීක්ෂණයකින් පසු ලිඛිත විභාගයේ දී අයදුම්කරුවන් ලබා ගත් ලකුණු කුසලතා අනුපිළිවෙල මත පමණක් III ශ්‍රේණියේ මැනුම් ක්ෂේත්‍ර සහායක වශයෙන් බඳවා ගනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව අනුව සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

9.0 අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ.මී 21 x 29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතුය. අංක 1.0 සිට 4.0 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 5.0 – 9.0 දක්වා ශීර්ෂ 02 පිටුවේ ද, අංක 10.0 – 12.2 දක්වා ශීර්ෂ 03 පිටුවේ ද ඇතුළත්වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානින් මගින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානින් මගින් ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කළ යුතු වේ.

(ඇ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

(ඈ) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ඉ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

9.1 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට *ගැසට්* නිවේදනයේ 5 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කළ යුතු වේ. නියමිත විභාග ගාස්තු ගෙවා **2025.10.22** වන දින හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සර්වේයර් ජනරාල්වරයා විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ "ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවලට බඳවා ගැනීම - මැනුම් ක්ෂේත්‍ර සහායක" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

9.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10.0 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු.800/- කි. මෙම මුදල කොළඹ 05, තැ.පෙ.506 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම්

හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව වෙත ගෙවා ලබා ගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.0 *අයදුම්පත්‍ර යොමු කිරීම :*

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2025.10.22** වන දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

සර්වේයර් ජනරාල්,
විභාග අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ.පෙ.506,
කොළඹ 05.

11.1 ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ලැබේ. නිවේදනය පළ වී දින 03ක් හෝ 04 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් ඒ බව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විභාග අංශය වෙතින් විමසිය හැකිය.

12.0 විභාගයට පෙනී සිටීම :
විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකුම විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී ම විභාගයට පෙනී සිටිය යුතුය.

13.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :
විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු රියදුරු බලපත්‍රය

14.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

වයි. ජී. ඥානතිලක
සර්වේයර් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 10 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
කොළඹ 05.

## ආදර්ශ අයදුම්පත්‍රය

## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2025

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

විභාගයට පෙනී සිටින මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

1.0 1.1 මුලකුරු සමග නම : (මුලකුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: PERERA A.B.C
.............................................................................................................................

1.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................
.............................................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................
.............................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.5 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

1.6 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

1.7 ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M , ස්ත්‍රී – F) ☐

1.8 විවාහක /අවිවාහක බව : විවාහක: ☐ අවිවාහක : ☐

2.0 ස්ථිර ලිපිනය :

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්: ..............................................................................................................................

..............................................................................................................................

2.2 සිංහලෙන් /දෙමළෙන් :..............................................................................................................................

..............................................................................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ..............................................................................................................................

..............................................................................................................................

3.0 3.1 ලිපිනය අයත් පරිපාලන දිස්ත්‍රික්කය (උපලේඛන 1 බලන්න)

දිස්ත්‍රික් අංකය : ☐ දිස්ත්‍රික්කයේ නම : ☐

3.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද?........................................................................

4.0 දුරකථන අංකය :

ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐ ජංගම: ☐☐☐☐☐☐☐☐☐☐

5.0. අධ්‍යාපන සුදුසුකම්: අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර : (අදාළ සහතිකවල, සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.)

5.1 පළමුවර:

විභාග වර්ෂය හා මාසය : ......................................... විභාග අංකය: .........................................

සමත් වූ විෂයන් :

| විෂය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

5.2 දෙවන වර:
විභාග වර්ෂය හා මාසය : ......................................... විභාග අංකය: .........................................
සමත් වූ විෂයන්:

| විෂය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

6.0 වෘත්තීය සුදුසුකම්: මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුරට නියමිත පරිදි ලබා ගෙන ඇති N.V.Q නිපුණතාවය පිළිබඳ විස්තර සඳහන් කරන්න (ක්ෂේත්‍රයට අදාළ සහතිකවල, සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය.) :
.........................................................................................................................................................

7.0 වෙනත් සුදුසුකම්: ...............................................................................................................................

8.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
(√) ලකුණ යොදන්න.

ඔව් ☐ නැත ☐

8.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න :.........................................................................................................
.........................................................................................................................................................

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ........................................................
II. ලදුපත් අංකය හා දිනය : ........................................................
III. ගෙවූ මුදල : ........................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

10.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව දැන සිටිමි.

(ඇ) රු. ................. ක් ගෙවා ලබා ගත් ලදුපත අදාළ ස්ථානයේ අලවා ඇත.

(ඈ) තවද විභාග පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඉ) මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

......................................
අයදුම්කරුගේ අත්සන

දිනය:..........................

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:

මෙම අයදුම් පත ඉදිරිපත් කරන ................................................ නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............................ දින මා ඉදිරිපිට දී ඉහත 10.0 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

.......................................
සහතික කරන්නාගේ අත්සන.

දිනය: ...........................
සහතික කරන්නාගේ නම: ..............................
තනතුර: ..............................
ලිපිනය: ..............................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

12.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය / අසතුටුදායකය, සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත, කිසිදු විනය දඬුවමකට ලක්ව ඇත / නැත.

12.2 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරා ගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය / නොහැකි ය.

අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

..........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නිල මුද්‍රාව

දිනය: ............................

## උපලේඛනය I

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 3.1 හි සඳහන් ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාළ වේ.

| *නගරය/දිස්ත්‍රික්කයේ නම* | *නගර / දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| 1. කොළඹ | 01 |
| 2. ගම්පහ | 02 |
| 3. කළුතර | 03 |
| 4. මහනුවර | 04 |

| *නගරය/දිස්ත්‍රික්කයේ නම* | *නගර / දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| 5. මාතලේ | 05 |
| 6. නුවරඑළිය | 06 |
| 7. ගාල්ල | 07 |
| 8. මාතර | 08 |
| 9. හම්බන්තොට | 09 |
| 10. කුරුණෑගල | 10 |
| 11. පුත්තලම | 11 |
| 12. අනුරාධපුරය | 12 |
| 13. පොළොන්නරුව | 13 |
| 14. බදුල්ල | 14 |
| 15. මොණරාගල | 15 |
| 16. රත්නපුර | 16 |
| 17. කෑගල්ල | 17 |
| 18. අම්පාර | 18 |
| 19. මඩකලපුව | 19 |
| 20. ත්‍රිකුණාමලය | 20 |
| 21. යාපනය | 21 |
| 22. වවුනියාව | 22 |

09-166

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

01. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2025 දෙසැම්බර්** මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025 ඔක්තෝබර් මස 17** දින වේ.

*සටහන* - මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 සැප්තැම්බර් මස 22** වැනි දින පෙ.ව. **9.00** ට විවෘත වන අතර **2025 ඔක්තෝබර් මස 17** වැනි දින රාත්‍රී **9.00**ට අවසන් වේ.

අයදුම්පත් යොමුකිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. *විභාගය :*

*2025 දෙසැම්බර් මාසයේ* දී විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ඉහළ ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ. මෙම විභාගය පහත සඳහන් නගරවල දී පැවැත්වේ. එම නගර සහ නගරවලට අදාළ නගර අංක පහත පරිදි වේ. ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතු මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයන්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනකගේ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම්, විභාගය කොළඹ දී පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| මඩකලපුව | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුර | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව, රෙජිස්ට්‍රාර් සේවය III පන්තියේ II ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගනු ලැබේ :-

(i). මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය. තේරීපත්වන අයදුම්කරුවන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය ;

(ii). රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/2/1/25/1/3/2011 සහ 2012.05.08 දිනැතිව අනුමත කරන ලද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි ඛණ්ඩ 2 නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට ද එම බඳවා ගැනීමේ පටිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත් විය යුතු ය ;

(iii). සේවයට පත් කරන නිලධාරියකු පත්වීම් බලධාරියා තීරණය කරන පරිදි පුහුණුවකට යටත් විය යුතු ය ;

(iv). මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. තනතුරකට පත්වී වසර තුනක් ගතවීමට පෙර රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන **කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත විභාගය** සමත් විය යුතු ය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු නොලැබේ ;

(v). පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

04. *වැටුප් පරිමාණය :*

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 05-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය

**රු.58,660 -10 x 1,190-11x 1,360 -15x 1,670 -රු.110,570** ක්වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

05. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නොඅඩු සහ අවුරුදු තිස්පහට නොවැඩි විය යුතු ය. (ඒ අනුව **2004.10.17** දිනට හෝ ඊට පෙර හා **1990.10.17** දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා සුදුසුකම් ඇත.)

06. *සුදුසුකම් :*

**2025.10.17** දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i). අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතු ය;

(ii). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියකු වීම ;

*හෝ*

(iii). ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන නීති විභාගයෙන් සමත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී ඇති නීතිඥවරයකු විය යුතුය.

07. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :*

විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතු ය. එසේ ලබාගත් අයදුම්කරුවන් තෝරා, ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව, ඉහළම ලකුණු ලැබූ අය සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සහතික පත්‍ර පරීක්ෂා කිරීමට පමණක් මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

08. *විභාග කොන්දේසි :*

8.1 අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතු ය ;

8.2 විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය :-

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)

iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon)

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන :-*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

8.3 ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

8.4 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

8.5 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

8.6 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු

වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ මුද්‍රිත පිටපත සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

09. අත්සන සහතික කිරීම :

විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු/ඇය විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් බාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතුය.

10. විභාග මධ්‍යස්ථානයට ඇතුළු වීම :

(i). විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු, විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii). සෑම විභාග අපේක්ෂකයකුම තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාග අපේක්ෂකයන් විසින් අනුගමනය කළ යුතු පොදු නීති රීතිවලට යටත් විය යුතුය.

11. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

(i). විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගුවේ. :-

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

(ii). එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගත යුතුය. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්:

(i). අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ii). අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

13. මෙම රෙගුලාසිවලින් සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

14. විභාග පරිපාටිය :

(i). **මාධ්‍යය :**

(අ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය අතුරින් එක් මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැක.
(ආ) සියලුම අයදුම්කරුවන්, ඉල්ලුම් කර ඇති භාෂා මාධ්‍යයෙන්ම සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.
(ඇ) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට කිසිම අපේක්ෂකයකුට ඉඩදෙනු නොලැබේ.

(ii). **විෂයයන් සහ විෂය නිර්දේශය :**

විභාගය, පහත සඳහන් විෂයයන් පිළිබඳව ලිඛිත ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ. :-

| *විෂය* | *විෂය අංකය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| අභියෝග්‍යතාව | 01 | පැය 1.00 | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | 02 | පැය 1.00 | 100 | 40 |
| භාෂා හැකියාව | 03 | පැය 1.00 | 100 | 40 |

විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. අභියෝග්‍යතාව :<br><br>ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | අපේක්ෂකයාගේ තර්කානුකූල විශ්ලේෂණ ශක්තිය හා වාචික නොවූ ප්‍රස්තුත ආශ්‍රයෙන් ඉදිරිපත් කෙරෙන තොරතුරු පිළිබඳව වලංගු නියමයන්ට එළඹීමට ඇති හැකියාව හා දැනුම මැනීම පිණිස සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. |
| 02. සාමාන්‍ය දැනීම :<br><br>ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | ශ්‍රී ලංකාවේ සමාජමය හා සංස්කෘතික රටාව හා ජාතික මෙන්ම අන්තර්ජාතිකව ද වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
| 03. භාෂා හැකියාව :<br><br>ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | දෙන ලද මාතෘකා තේමා ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම ගොනු කිරීම විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා කිසියම් අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 10 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

09-181

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### බටහිර සංගීත ප්‍රායෝගික පරීක්ෂණය - 2024 (2025)

### I ශ්‍රේණිය සිට VIII ශ්‍රේණිය දක්වා සහ ඩිප්ලෝමා

ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන ඉහත පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පරීක්ෂණය **2025 දෙසැම්බර් මස කොළඹ දී** පැවැත්වීමට කටයුතු යොදා ඇත.

අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ Our Services යටතේ ඇති Online Applications-Recruitment Exams ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත **අයදුම්පත් භාර ගැනීම 2025 සැප්තැම්බර් මස 19 වැනි දින පෙ. ව. 09.00ට විවෘතවන අතර 2025 ඔක්තෝබර් මස 17 වැනි දින ප. ව. 09.00ට අවසන්වේ.** අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත්අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ සහතිකවල පිටපත් සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතුය ලිපිනය : විභාග කොමසාරිස් ජනරාල්,
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
පැලවත්ත, බත්තරමුල්ල

2. සුදුසුකම් :-

මෙම පරීක්ෂණයට අයදුම්කරනු ලබන සෑම අයදුම්කරුවකුම අයදුම්කරනු ලබන ශ්‍රේණිය හෝ ඩිප්ලෝමාව සඳහා අදාළ ලිඛිත විභාගය සමත් වී තිබීම අනිවාර්ය වේ.

(***සැ. යු.-*** අයදුම්පතේ මුද්‍රිත පිටපත සමග අදාළ සහතිකවල පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.)

3. විෂය නිර්දේශය :-

විභාග කොමසාරිස් ජනරාල් විසින් 1993 වර්ෂයේ සිට ඉදිරියට බල පැවැත්වෙන ලෙස නිදහස් කර ඇති විෂය නිර්දේශයට අනුව මෙම පරීක්ෂණය පැවැත්වේ. විෂය නිර්දේශය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. අයදුම් කිරීම :-

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පරීක්ෂණය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

5. විභාග ගාස්තු :-

මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තු පහත සඳහන් පරිදි වේ :-

| | | |
|---|---|---|
| I - IV දක්වා එක් ශ්‍රේණියක් සඳහා | - | රු. 600 |
| V - VIII දක්වා එක් ශ්‍රේණියක් සඳහා | - | රු. 800 |
| Diploma (Teachers) | - | රු. 2000 |
| Diploma (Performers) | - | රු. 2000 |

විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත සඳහන් ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon);
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන :-*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා

ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ ආපසු ගෙවීමක් හෝ සිදුකරනු නොලැබේ.

6. විභාග ප්‍රවේශ පත්‍ර :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් වෙබ් නිවේදනයක් මගින්/අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

8. අපේක්ෂක අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ. :-

i. ජාතික හැඳුනුම්පත ;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

9. ප්‍රතිඵල :
මෙම විභාගයේ ප්‍රතිඵල දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරන අතර විභාගය සමත්වන සෑම අයදුම්කරුවකුටම විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 10 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

09-165

**ඉඩම් මැනුම් සභාව**

ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය සඳහා, ප්‍රායෝගික පළපුරුද්ද ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා අයදුම්පත් කැඳවීම

2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වගන්තිය අනුව ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික පළපුරුද්ද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත. ඒ අනුව එම ප්‍රායෝගික පළපුරුද්ද ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට ඉඩම් මැනුම් සභාව තීරණය කර ඇත.

ඒ අනුව එකී මැනුම් පනතේ 39 වගන්තිය හා එක්ව කියවිය යුතු උපලේඛනයේ (අ) කොටසෙහි සඳහන් ශාස්ත්‍රීය සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්ට මේ සඳහා අයදුම්කළ හැකි අතර, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරුන් ලෙස දැනටමත් පුහුණුව ලබන තැනැත්තන්ට මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

සියලු අයදුම්කරුවන් www.landsurveycouncil.org දරන ඉඩම් මැනුම් සභාවේ නිල වෙබ් අඩවියට ඇතුළත් කර තිබෙන අයදුම්පත මගින් මාර්ගගත ක්‍රමය ඔස්සේ තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එකී අයදුම්පතෙහි බාගත කර ගන්නා ලද ඈඩ පිටපතක් **2025.10.10** දින හෝ එදිනට පෙර ලැබෙන සේ ''ලේකම්, ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාල, අංක 150, බර්නාඩ් සොයිසා මාවත, කොළඹ 05'' යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමුකළ යුතුය.

වයි. ජී. ඥානතිලක,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

2025 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ 05, බර්නාඩ් සොයිසා මාවත,
අංක 150, සර්වෙයර් ජනරාල් කාර්යාලය,
ඉඩම් මැනුම් සභාවේ දී ය.

09-213

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.